# ලැගුම්හල් සිද්ධිය හා ජනවාර්ගික ශුද්ධ කිරීම

පසුගිය සතියේ කොළඹ ලැගුම්හල්වල නැවතී සිටි දෙමළ ජනවර්ගයට අයත් තුන්සීයක් පමණ ප්‍රමාණයක් වවුනියාවට හා වෙනත් ප්‍රදේශවලට බස්රියවලින් ගෙනයෑමෙන් ආණ්ඩුවට ප්‍රශ්න රාශියකට මුහුණ පෑමට සිදුවිය. ඒ ආණ්ඩුව අතින් කෙරුණු වරදක් විය. එහි දී අගමැති රත්නසිරි වික්‍රමනායක මහතා ආණ්ඩුව වෙනුවෙන් වරද පිළිගෙන කණගාටුව ප්‍රකාශ කළා පමණක් නොව ආණ්ඩුව ඒ පිරිස් ආපසු ගෙන ඒමට ද කටයුතු කෙළේ ය. ඒ අතර මෙරට ශ්‍රේෂ්ඨාධිකරණය එසේ පුද්ගලයන් ඉවත්කිරීමට විරුද්ධව ආණ්ඩුවට එරෙහිව තීන්දුවක් ද දුන්නේ ය.

කොළඹ කොටි ඉන්නා බවත් ඔවුන් තැන තැන බෝම්බ පුපුරුවන බවත් වැඩිපුර පිටරට සිටින රනිල් වික්‍රමසිංහ මහතා වුව ද දන්නා කරුණු යැයි සිතමි. ඒ කොටි බොහෝ දෙනකු වික්‍රමසිංහ මහතා අත්සන්කළ ඊනියා සටන් ගිවිසුම ක්‍රියාත්මක වූ කාලයේ දී කොළඹට පැමිණි අය බව රනිල් වික්‍රමසිංහ මහතා පමණක් නොව සර්ව පාක්ෂික කමිටුවේ හා එහි නියෝජිත කමිටුවේ එ ජා පක්ෂය නියෝජනය කරන චොක්සි මහතා ද දන්නා කරුණකි. කොළඹ ජීවත්වන කොටි අත් අඩංගුවට නොගත යුතු යැයි කියන්නෝ කොටි හෝ ඔවුන්ගේ මිතුරෝ  හෝ වෙති.

ලැගුම්හල්වල ජීවත්වන්නවුන්ගෙන් බොහෝ දෙනා කොටි යැයි සිතිය හැකි නො වෙයි. එහෙත් ඔවුන් අතර කොටි ද සිටිනු නො අනුමාන ය. එසේ වුවත් කොටි වැඩිපුර ම ඇත්තේ තරු හෝටල්වල හා වැල්ලවත්තේ හා වෙනත් ප්‍රදේශවල පසුගිය සමයේ ඉදි කෙරුණු සුවිසල් ගොඩනැගිලිවල බව බොහෝ දෙනාගේ මතය වෙයි. ලැගුම්හල්වල ජීවත්වන්නවුන්ගෙන් ඇතැම් අයට තමන් එසේ සිටින්නේ කිනම් කරුණක් නිසාදැයි කිව නොහැකි වී ඇත. ආණ්ඩුව ආපසු යැවීමට පියවර ගෙන ඇත්තේ එවැනි පිරිස් ය.

මේ සිද්ධියෙන් පසුව මෙරට රාජ්‍ය නොවන සංවිධානවලට හා ඇතැම් මාක්ස්වාදී පක්ෂවලට නැවතත් ලිප්ටන් වටරවුමට ඒමට හැකිවිය. අඩන්නට සිටි අයට ඇඟිල්ලෙන් ඇනීමක් වැනි දෙයක් සිදුවීමෙන් මේ පිරිස්වලට තමන්ට ලැබෙන මුදල් වෙනුවෙන් යම් කාර්යයක් කිරීමේ භාග්‍යය උදාවිය. මේ අයට අද පැවැත්මක් ඇත්තේ ප්‍රභාකරන්ට පින්සිදුවන්නට ය. කොටි නැති වූ දිනක මොවුන් උන්නාද මළාද යැයි දන්නා අයකු සොයාගැනීම අපහසු වනු ඇත.

කොළඹින් දෙමළ ජනයා තුන්සියයක්, වැඩිම වුවහොත් පන්සියයක් ඉවත්කිරීම ජනවාර්ගික ශුද්ධකිරීමක් ලෙස හැඳින්වීමට කොටි, බටහිර පුවත්පත් ඇතුළු ජනමාධ්‍ය, මෙරට පත්තර කඩමාළු හා වෙනත් මාධ්‍යකඩමාළු, ඇතැම් එ ජා ප මන්ත්‍රීවරු හා කොටි හිතවත්තු ඉදිරියට පැමිණියහ. කොෘළඹ නාගරික සභා සීමාවෙහි එක්ලක්ෂ විසිපන්දාහකට අධික දෙමළ ජනයා ජීවත්වෙති. ඔවුන්ගෙන් තුන්සියයක් ඉවත්කිරීම ජනවාර්ගික ශුද්ධකිරීමක් ලෙස හඳුන්වන්නේ නම් බටහිර රටවල සියවස් ගණනාවක් තිස්සේ සිදුවන ක්‍රියා හැඳින්වීමට වචනයක් නැතිවනු ඇත. එහෙත් බටහිර ඉංගිරිසි ජනමාධ්‍යවලට ද එවැනි කරුණු වැදගත් නො වී ය. ඉංගිරිසි බස ගණිකා වෘත්තියෙහි යොදවමින් කතුවරු දෙමළ ජනයා තුන්සීයක් ඉවත්කිරීම ජනවාර්ගික ශුද්ධ කිරීමක් ලෙස හැඳින්වූහ.

ඒ අතර දෙමළ ජනයාගේ ඊනියා මානව අයිතිවාසිකම් ගැන ද කතාකිරීමට බටහිරයෝ හා මෙරට ඔවුන්ගේ ගැත්තෝ පෙරට පැමිණියහ. මේ අයගෙන් ඉතා වැඩි පිරිසකට අසූවේ දශකයේ අග හා අනූවේ දශකයේ මුල ජ වි පෙරමුණේ සාමාජිකයනට හා පොදුවේ සිංහල තරුණ තරුණියන්ට මානව අයිතිවාසිකම් තිබූ බව අමතක විය. එදා හමුදාවෙන් හා පොලීසියෙන් අත් අඩංගුවට ගැණුනේ ජ වි පෙ සාමාජිකයන් පමණක් නො වේ. අහිංසක සිංහල තරුණ තරුණියෝ ද එසේ අත් අඩංගුවට ගැනිණි. එහෙත් කවුරුත් දන්නා කරුණක් නම් මෙරට ඊනියා මානව අයිතිවාසිකම් ඇත්තේ ඊනියා සුළු ජනවාර්ගිකයනට පමණක් බව ය.

එකල ඇතැම් මාක්ස්වාදීහු ජ වි පෙරමුණට විරුද්ධව ධනපති එ ජා පක්ෂ ආණ්ඩුවෙන් අවි ලබාගත්හ. ඔවුන් අතර එවකට නව සමසමාජ පක්ෂ නායකයන් වූ වික්‍රමබාහු කරුණාරත්න, වාසුදේව නානායක්කාර හා සිරිතුංග ජයසූරිය යන මහත්වරු ද වූහ. එදා එ ජා පක්ෂය අද ආණ්ඩුව මානව හිමිකම්වලට කරන ගෞරවයෙන් සීයෙන් එකක් හෝ කෙළේ නම් ඔවුන්ට කිසි දිනෙක ජ වි පෙරමුණ පරාජය කිරීමට නොහැකි වනු ඇත. එදා සිංහලයන්ගේ මානව

© Prof. Nalin De Silva

අයිතිවාසිකම් ගැන කතාකිරීමට බ්‍රිතානි පුවත්පත් ඉදිරිපත් නො වීය. අප ඇතැම් අවස්ථාවල පෙන්වා දී ඇත්තේ බටහිර සම්මත වී මානව අයිතිවාසිකම් යනු බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියේ මානව අයිතිවාසිකම් මිස ඊනියා වාස්තවික අයිතිවාසිකම් නොවන බව ය.

කොළඹ ලැගුම්හල්වලින් දෙමළ ජනයා ඉවත්කිරීමට විරුද්ධව මෙරට ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දුන්නේ ය. ඒ තීන්දුව දුන්නේ සිංහල විනිශ්චයකරුවන් යැයි කීමට ඉහත කී මානව අයිතිවාසිකම් රකින්නන්ගේ දිව නො නැමෙයි. යම් අයුරකින් ඒ විනිසුරුවන් ආණ්ඩුවට පක්ෂව තීන්දුවක් දුනි නම් කුමක් සිදුවීමට තිබිණි ද? සිංහල ආණ්ඩුවේ දෙමළ විරෝධි ක්‍රියා සිංහල ශ්‍රේෂ්ඨාධිකකරණයක් විසින් අනුමත කරනු ලැබීම පිළිබඳ ව නැවතත් ලිප්ටන් වටරවුමට යැමේ භාග්‍යය ඊනියා මානව හිතවාදීන්ට උදාවීමට නියමිත ව තිබුණි.

ආණ්ඩුව අතින් සිදු වූ වරදට අගමැතිතුමා කණගාටුව පළ කර ඇත. එ ජා පක්ෂය  ඒ පක්ෂයේ ආණ්ඩුව විසින් කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් මේ වන තුරු ද කණගාටුවක් හෝ ප්‍රකාශ කර නැත. ඒ ගැන බ්‍රිතානිය ද කිසිවක් කියා නැත. එහෙත් අද බ්‍රිතානිය නැවත වරක් එහි උප ඇමතිවරයකු ලවා කියවන්නේ ආණ්ඩුව කොටි සංවිධානයට එරෙහිව කරන මෙහෙයුම් නවතා වහාම සාකච්ඡා කළ යුතු බව ය. හොවල්ස් නමැති මේ උප ඇමතිවරයා මෙන් ම එ ජා පක්ෂය ද ඊනියා මාක්ස්වාදීහු ද රාජ්‍ය නොවන සංවිධානවල සේවකයෝ ද කොටි ද ආදී පිරිස් සිංහල විරෝධී වෙති. ඔවුහු සියල්ලෝ ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ මානව අයිතිවාසිකම් රකිති. මේ උප ඇමතිවරයා ගැන සඳහන් කරමින් රාජ්‍ය ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා පවසා ඇත්තේ ආණ්ඩුව බටහිරයන්ගේ පදයට නැටීමට සූදානම් නැති බව ය. එසේ ප්‍රකාශ කිරීම පිළිබඳ අපේ ගෞරවය රාජපක්ෂ මහතාට හිමිවෙයි.

බටහිරයන් හා ඔවුන්ගේ ගැත්තන් කුමක් කීව ද ඊනියා සුළු ජනවර්ගවලට ලංකාවේ තරම් වෙනත් කිසිම රටක අයිතිවාසිකම් නැත. කොළඹ ජනවාර්ගික ශුද්ධකිරීම් ගැන කතාකරන්නෝ කොළඹ නගරාධිපතිවරයා මුස්ලිම් බව අමතක කරති. අද පමණක් නොව ඉහත දී ද මුස්ලිම් දෙමළ ජනවර්ගවලට අයත් කොළඹ නගරාධිපතිවරු සිටිය හ. වෙනත් නගරවල ද එවැනි උදාහරණ දැක්විය හැකි ය. සිංහල නොවන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිංහලයන් බහුතරය වූ ඡන්ද කොට්ඨාශවලින් පත් වී ඇත්තේ වරක් දෙවරක් නො වෙයි.

ලංකාවේ රාජ්‍ය පාලනයට ඊනියා සුළු ජනවාර්ගිකයන් සහභාගි කරනොගන්නේ යැයි එදා සිට ම චෝදනා වෙයි. එහෙත් අද මෙරට අමාත්‍ය මණ්ඩලයේ සිංහලයන් නොවන්නෝ කොතෙක් වෙත් ද ? මේ ඇතැම් සුළු ජනවාර්හික පක්ෂවල ඇමතිවරුන් යටතේ ඇති සංස්ථා හා වෙනත් ආයතනවල සභාපතිකම් දරන්නෝ ද ඒ ඒ ජනවර්ගවලට අයත්වූවෝ වෙති. අනෙක් සභාපතිවරුන්ට මෙන් ම ඔවුන්ට ද ආණ්ඩුවේ යාන වාහන හා වෙනත් වරප්‍රසාද හිමිවෙයි. ඒ අදාළ ඇමතිවරු පිටරට සංචාරය කරන විට ඇතැම් අනුගාමිකයෝ ද ඒ සමග යති. ඔවුහු ඒ වරප්‍රසාද භුක්ති විඳින අතර ම මෙරට සුළු ජනවර්ගවලට ඇත්තේ දෙවැනි පංතියේ පුරවැසි අයිතිවාසිකම් පමණක් යැයි කෑමොර ගැසීමට අමතක නො කරති. කිසිවකු ඒ වරප්‍රසාද සාමාන්‍ය දෙමළ මුස්ලිම් ජනතාවට නැතැයි, කීමට ඉඩ ඇත. ඔවුන් අමතක කරන කරුණ නම් සාමාන්‍ය සිංහල ජනයාට ද ඒ වරප්‍රසාද අහිමි බව ය.

ලංකාවේ මුස්ලිම් කාන්තාවනට තම අනන්‍යතාව පෙන්වන ලෝගුව වැනි ඇඳුම ඇඳීම තහනම් නොවුණ ද එංගලන්තය, ප්‍රංශය වැනි බටහිර ඇතැම් රටවල ඒ තහනම් වෙයි. එයට හේතුව මුස්ලිම් කාන්තාවන් එලෙස ඇඳීමෙන් ඉංගිරිසි සුදු පිරිමින්ට ඒ කතුන්ට නිසියාකාරව කන්දීමට ඇති මානව අයිතිය නැති වී යැම ය. එංගලන්තයේ ඉහළම අධිකරණය වූ සාමි මන්ත්‍රණ සභා අධිකරණය එරට මුස්ලිම් කතුන්ට එරෙහිව තීන්දුවක් දී ඇත්තේ සුදු පිරිමින්ගේ අයිතිවාසිකම්වලට සවන් දීමෙන් පසුව ය. මේ අධිකරණ තීන්දු ගැන බ්‍රිතානි ජනමාධ්‍ය සාමාන්‍යයෙන් නිහඬ ය. මෙරට ශ්‍රේෂ්ඨාධිකරණය ලැගුම්හල්වලින් දෙමළ ජනයා ඉවත්කිරීමට එරෙහිව දුන් තීන්දුව ඇගයිය යුත්තේ බ්‍රිතානි අධිකරණය සමග සංසන්දනය කිරීමෙනි. ඒ කෙසේ වෙතත් අද අපේ ප්‍රධාන කාර්යභාරය විය යුත්තේ හමුදා ක්‍රියාමාර්ගවලින් කොටි පැරදවීම ය. එහි දී ඊනියා මානව අයිතිවාසිකම්කරුවනට කිසිදු ඉඩක් දිය යුතු නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva